# ඉන්දු-ශ්‍රී ලංකා සමාජ සංස්කෘතික සබඳතා : අජන්තා සහ සීගිරි සිතුවම් ඇසුරින්

*ඈපා, අමල්කා මධුෂාණි* [1]

ඉන්දීය කලාකරුවාගේ ප්‍රතිභාපූර්ණ දෑතින් නිම වූ අනගිභවනීය කලා තෝතැන්නකි, අජන්තාව. ඒ හා අතිශය සමාන කලාකෘති හමුවන විස්මිත ලෝක උරුමයක් ශ්‍රී ලංකාවෙන්ද හමුවේ, ඒ සීගිරියයි. පිහිටි පර්වතය අභ්‍යන්තරයට හාරා නිර්මාණය කළ **'දඹදිව මහා කලා කෙත'** යන විරුදාවලිය ලත් අජන්තාව වූ කලි බෞද්ධ ලෙන් විහාරයකි. කාශ්‍යප රජ දවස බලකොටුවක් ලෙසින් ගොඩනැංවූ සීගිරි පර්වතය ලෝක ජනාදරයට පාත්‍ර වීමට එහි ඇති අතිවිශිෂ්ට ගණයේ බිතුසිතුවම් රැසද බලපා ඇත. සීගිරිය හා අජන්තාව තුළ හමුවන සිතුවම් එකිනෙකට නෑකම් කියනුයේ ශෛලිය අතින් පමණක් නොවේ, භාවාත්මක ප්‍රකාශන ශක්තිය සහ සංරචනයද ඒ කෙරෙහි ඉවහල්වී ඇත. ඒවා එකිනෙකට වෙනස් වන්නේ යොදාගන්නා වස්තු විෂය හේතුවෙනි. අජන්තා ශිල්පියා තම සිතුවම් සඳහා ජාතක කතා හා බෝධිසත්ව චරිතය පාදක කොට ගත් අතර, සීගිරි ශිල්පියා විසින් වස්තු විෂය ලෙස කාන්තා රූප තෝරා ගෙන ඇත. ඒ හැරුණු කොට වඩාත් අවධානයෙන් සිතුවම් එකිනෙක සැසඳීමේ දී ඒවායේ නිමාව සිදුවූයේ එකම ශිල්පියෙකු අතින් බවටද අදහසක් මතුවේ. මෙම සිතුවම් ආනන්ද කුමාරස්වාමි, පරණවිතානයන් ආදි විද්වතුන් රැසකගේ මතභේදයන්ටද තුඩු දී ඇත. එම කලා කෘති සංසන්දනය ඔස්සේ පර්යේෂණාත්මක විග්‍රහයක යෙදෙමින් ඒ ඒ ශෛලීන් අතර පවත්නා ලක්ෂණාත්මක භාවයන් හඳුනා ගැනීම සහ චිත්‍රවල ශිල්පීය පාර්ශවය පිළිබඳ විමර්ශනාත්මකව කරුණු අනාවරණය කිරීමද මාගේ අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වේ. මෙය සන්සන්දනාත්මක අධ්‍යයනයක් වන අතර ඒ සඳහා සිතුවම් දර්ශන, විචාරක මත යනාදියද උපයෝගී කර ගන්නා ලදි. සීගිරි හා අජන්තා සිතුවම්වල රේඛාවේ සජීවී බවට පණ පොවා ඇත්තේ ශිල්පියාගේ සතතාභ්‍යාසය හා අපූර්වත්වයයි. සැබැවින්ම මෙම සිතුවම් ලංකාව සහ ඉන්දියාව අතර ඇති සමාජ, සංස්කෘතික සබැඳියාව සහ සමරූපීතාවය ගෙන හැර දැක්වීමට වැදගත් සාධක සපයන බව ඉහත කී අධ්‍යයනය මගින් නිගමනය කළ හැකි විය.

**ප්‍රමුඛ පදඃ** සිතුවම් කලාව, අජන්තාව සහ සීගිරිය, ශෛලිය, කලාකෘති

*[1]ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, හින්දී අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*amamadhusha1517@gmail.com*